04/07/2010 - ඉරිදා ලංකාදීප

**ජීවන වියදම අඩුකිරීමට වඩා තරඟකාරීත්වයෙන් නිෂ්පාදනය වැඩි කිරීම**

පසුගිය සති කිහිපය තුළ අත්‍යවශ්‍ය භාණ්ඩ ගණනාවක මිළ ඉහල ගියේය. එළවලු, කිරිපිටි, සීනි, තිරිඟු පිටි මිළ වැඩිවීම සාමාන්‍ය මහජනතාවට දරාගත නොහැකිය. එදිනෙදා අදායමින් ජීවිතය ගැටගසා ගන්නා දුප්පත් ජනතාව මේ නිසා පත්ව ඇත්තේ මහත් පීඩාවකටය. රජයේ සංඛ්‍යා ලේඛන අනුව පවුල් ලක්ෂ හයක් පමණ සමෘද්ධි සහන ලබති. දරිද්‍රතාවයේ අවම මට්ටමේ සිටින මෙම පවුල්වලට සමෘද්ධි සහන වශයෙන් ලැබෙන රුපියල් තුන් හාරසියය ගැන බලනවිට ජීවත්වීම අමාරු බව තේරුම් ගැනීම අපහසු නැත. රජයේ වැටුප් හා සහන ලබන පිරිස ද විශාලය. අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය මිල වැඩි වන විට මෙම පිරිස එයට මුහුණ දෙන්නේ කෙසේද?

ආපසු හැරී බලන විට සහල් සේරුව ශතයකින් වැඩිවීම නිසා උද්ඝෝෂණ ඇතිවී ආණ්ඩු බලයෙන් පහවූ ඉතිහාසයක් අපට ඇත. ජීවන වියදමට එරෙහිව ගෙන ගිය ජූලි වැඩ වර්ජනය අවසන් වූයේ ලක්ෂ ගණනකගේ රුකියා අහිමි කරමිනි. බඩු මිල වැඩිවන විට ආණ්ඩුවට විරුද්ධව චෝදනා එල්ල කිරීම විපක්ෂයට පහසුය. බඩු මිල ගැන කතාකරන විට වැඩකරන ජනතාව ඉතාමත් පහසුවෙන් ආණ්ඩු විරෝධයකට ගෙන ආ හැකිය. එවිට ඇතිවන ගැටුම් හා මර්දනය රජය අපකීර්තියට ලක් කරනු ඇත.

ඉතිහාසයේ සිදුවූ සිදුවීම් හැමදාමත් සිදුවන්නේ එසේමය. ආණ්ඩු බලයට පත්වෙයි. භාණ්ඩ හා සේවා මිල වෙනස් වන විට මහජනතාව කනස්සල්ලට පත්වන අතර විපක්ෂය පහසුවෙන් පුවත්පත් නිවේදන නිකුත් කරයි. විරෝධතා රැළි පිකටිං හා පෙළපාලි සංවිධානය කරයි. එහි ප්‍රමුඛ ඉල්ලීම ''බඩු මිල අඩු කරව්'' එසේ නැතිනම් ''වැටුප් වැඩි කරව්'' යන සටන් පාඨයන්ය. බලයේ සිටි කිසිම ආණ්ඩුවකට මහජනතාවගේ මෙම ඉල්ලීම් දෙක නිවැරදිව සමබරව ඉටු කරන්නට හැකිවූයේ නැත. එය පහසු හා ප්‍රායෝගිකව කළ හැකිදෙයක් ද නොවේ. මහජන ඉල්ලීම් අනුව සහන සලසා අඩුමිලට භාණ්ඩ සපයමින් වැඩි වැටුප් දී ජනප්‍රිය ආණ්ඩුවක් වෙන්නට කිසිම පාලකයෙකු අකමැති නැත. එහෙත් එය කළනොහැකි බව පෙනෙන්නේ බලයට පත්වූ පසුය. විපක්ෂයේ සිට මහජනතාවට සහන දෙන්නැයි චෝදනා කරන දේශපාලන පක්ෂයම ඡන්දයෙන් ජයගෙන ආණ්ඩු බලය ගත් විට ගමන් කරන්නේ ද පරණ ආණ්ඩුවේ ප්‍රතිපත්ති මත බව පෙනෙන්නේ ටිකදවසක් ගතවීමෙන් පසුවය. ආණ්ඩුවලට කළහැකි දෙයක් නැතිබව බුද්ධිමත් ඡන්දදායකයන් දැන් තේරුම් ගනිමින් සිටී.

බඩු මිල වැඩි වෙන්නේ ඇයි? දේශීයව හා විදේශීයව සිදුවන උද්ධමනයේ බලපෑම එයට හේතුවයි. වැඩිවන උද්ධමනයට මුහුණ දෙන්නට නම් කෘත්‍රිමව බඩු මිල පාලනය කිරීම දිය යට

රබර් බෝලයක් බලයෙන් තෙරපාගෙන සිටීමට හා සමානය. තෙරපීම ඉවත්වූ වහා රබර් බෝලය දිය මතු පිටට පැමිණෙනවා පමණක් නොව ජල මට්ටමටත් වඩා ඉහලට පැන ජලතලාවේ කැළඹිල්ලකුත් ඇති කරයි. බලහත්කාරයේ රුඳවා ගන්නා උද්ධමනය රබර් බෝලයක් නම් එය පාලනය කර ගත නොහැකි වූ දින මහජනතාවට සිදුවන්නේ ජලතලයේ ඇතිවූ කැළඹිල්ලට සමාන අර්බුදයකට මුහුණ දෙන්නටය. උද්ධමනයට විසඳුම් දෙන බවට මහත් ආඩම්බරයෙන් කතා කරන ආණ්ඩු හැමවිටම කරන්නේ තමන්ගේ නිල කාලය අවසන් වනතෙක් උද්ධමන රබර් බෝලය දිය යට සඟවා තැබීමයි. ඡන්දයක් ලග එනවිට එය බොහෝවිට සිදුවෙයි. යහපත් ආර්ථිකයක ප්‍රමුඛ ලක්ෂණය විය යුත්තේ උද්ධමනයට මුහුණ දිය හැකි ආකාරයට මහජනතාවගේ ආදායම වැඩි කිරීමයි. ආදායම වැඩි කළ හැක්කේ ඉපැයීම නැංවීමෙන් විනා පවතින සුළු සම්පත් ප්‍රමාණය තම තමන්ට හැකි පමණින් බෙදාගැනීම නොවේ. ජීවන වියදම වැඩිවන විට රජයේ සේවකයන් විරෝධතා හා වැඩවර්ජන පවත්වන්නට පටන්ගනී. ඒවා යටපත්කරන්නට ආණ්ඩුව කරන්නේ තම භාණ්ඩාගාරයට එකතුවන බදු වලින් තවත් කොටසක් ඔවුන්ගේ වැටුප් වැඩි කරන්නට වෙන්කිරීමයි. ප්‍රශ්නය යටපත්වෙයි. රජයේ සේවයේ නැති පිරිසට එවැනි සහනයක් නැත. වඩා භයානක පැත්ත නම් රජය තම ආදායම නංවා ගැනීමට තව තවත් බදු පැනවීමයි. බදු පැනවීම නිසා භාණ්ඩ මිල තවත් වටයකින් ඉහලයයි. දෙස් විදෙස් ආයතන වලින් ණය ගනී. එවිට පොලියක් ගෙවන්නට සිදුවෙයි. උද්ධමනය තවත් වැඩිවෙයි. නිෂ්පාදනය වැඩි නොවී, කාර්යක්ෂමතාවයක් හෝ පලදායකත්වයක් ගැන තීන්දු නොගෙන ක්‍රියාකිරීම නිසා ශ්‍රී ලංකාව අද සිටින්නේ උද්ධමනය පාලනයකිරීම අසීරු හා භාණ්ඩ මිල පාලනය කිරීම කළනොහැකි අවධියකය. යථාර්තය එයයි.

බඩු මිල වැඩිවන විට එයට විරුද්ධව කතාකිරීමට වඩා රටක් වශයෙන් මේ ප්‍රශ්නයට මුහුණ දෙන ආකාරය ගැන වඩා පුලුල්ව සිතන්නට මහජන නායකයන්ට හැකිවිය යුතුය. ඉන්දියාවෙන් එළවලු ආනයනය කර මෙරට මිලට වඩා හරි අඩක් අඩුවෙන් අලෙවි කරන්නට හැකිය. ඇමරිකාවෙන් අර්තාපල් ආනයනය කළ හැකිය. එවිට ආනයනික අර්තාපල් මිල සැහෙන ප්‍රමාණයකින් පහත වැටේ. තායිලන්තයෙන් හෝ ඉන්දුනීසියාවෙන් අඩු මිලට සහල් ගෙන්වන්නට හැකිය. බිත්තර, මස්, මාලු පමණක් නොව පලතුරු පවා එතෙරින් ගෙන්වා අඩු මිලට දෙන්නට සම්පූර්ණ හැකියාව තිබේ. නමුත් ආණ්ඩුව ඒ තීරණය ගන්නේ නැත. මෙම කෘෂිකාර්මික වගාවන්හි නිරතව සිටින ලක්ෂ සංඛ්‍යාත පිරිසකගේ ආදායම් මාර්ගය එය වීම එයට බලපාන ප්‍රධානම හේතුවයි. අල ගොවියන් විසි තිස් දහසක් වෙනුවෙන් මිලියන විස්සක ලාංකිකයන් මෙරට ට ආනයනය කරන අර්තාපල් වැඩි මිලක් ගෙවා මිලදී ගනී. සහල් වෙළඳපොළත් එසේමය. රජය අතිවිශාල මුදලක් පොහොර සහනාධාර වශයෙන් ගොවියන්ට ලබා දෙන අතර එයින් නිපදවන සහල් ආනයනික සහල් වලට වඩා මිල වැඩිය. රජයට පොහොර සහනාධාර නතර කළ හැකිය. එවිට පොහොර සමාගම් වෙනුවෙන් පිටරට ඇදෙන මෙරට මහා ධන සම්පත ඉතිරිවෙයි. ඒ ඉතිරි කර ගන්නා මුදලත් සහල් ආනයනයේ අයකරන

බදුත් එකතුකර ගත්විට මෙරට ගොවියන්ට මාසිකව ස්ථිර වැටුපක් වශයෙන් ගෙවිය හැකිය. එහෙත් එසේ කළ නොහැක. එය ගෝලීයකරණයයි. ඇඟලුම්, තේ කර්මාන්තය, මැණික් හෝ ස්වර්ණාභරණ හෝ සංචාරක ව්‍යාපාරය වැනි අපට කළ හැකි දේ කෙරෙහි සම්පූර්ණයෙන් අවධානය යොමුකර අනෙක් දේ වලින් බැහැරවීම ගෝලීයකරණයයි. එහෙත් ගොලීයකරණය සාධාරණ නැත. එයට ඔරොත්තු දෙන්නට අපේ සමාජ වටපිටාව සූදානම් නැත. එය සාහසික එකක් බව අපගේ විනය හා බෞද්ධ ආකල්ප අඟවයි. වී ගොවිතැන හා කෘෂිකර්මය මෙරට ජන ජීවිතය හා සංස්කෘතිය හා සම්බන්ධ විශිෂ්ඨ දායාදයකි. කෘෂිකර්මය විනාශවුවහොත් ශ්‍රී ලාංකිකත්වය පත්වන්නේ බරපතල අනතුරකය. ඒ බව අප වටහා ගත යුතුය.

මේ නිසා රටක් වශයෙන් අප කළ යුතු වන්නේ විකල්පය සොයා ගැනීමයි. ඉන්දියාව, ඇමරිකාව හෝ තායිලන්තය මෙරටට වඩා අඩු මිලට භාණ්ඩ නිපදවන්නේ කෙසේ ද යන ප්‍රශ්නය අපෙන්ම විමසීමයි. ඉතාම වැදගත්වී ඇත්තේ තරඟකාරීත්වය ඇතිකිරීමයි. තරගකාරීත්වය තුළින් නිෂ්පාදනයේ තත්ත්වය දියුණුවෙයි. කාර්යක්ෂමභාවය ඇතිවෙයි. ඵලදායකත්වය වැඩිවෙයි. මේ නිසා නිතැතින්ම නිපැයුම ඉහලයන අතර එකම යෙදවුම් වලින් වැඩි නිපැයුමක් ලැබීම නිසා නිෂ්පාදන වියදම පහත වැටේ. එවිට බඩු මිල අඩු කළ හැකිය. මෙය කළ හැකිවන්නේ පුද්ගලයන් ව්‍යවසායකයන් බවට පත්කිරීමෙනි. රජයෙන් යැපෙන රජයේ සේවකයන් නොව ව්‍යාපාරයක්, කර්මාන්තයක් කරන අයෙකු බවට මේ රටේ හැම දෙනෙකුම පත්කිරීමෙනි. එය කළ හැක්කේ ආකල්ප වෙනසකින් පමණකි. උපාධිධරයා ගොවිපලට යවන, ධීවර වෘත්තියට යවන එයින් ව්‍යවසායකයෙකු වී යමක් නිපදවන පුද්ගලයෙකු බවට පත්කිරීමේ අධ්‍යාපනයක් රටට අවශ්‍යය. කම්හල හා ගොවිපල ආශ්‍රිතව ලක්ෂ ගණන් රැකියා මේ රටේ ඇත. ඇඟලුම් කම්හල්වල පුහුණු වෘත්තිකයන් හිඟවීම නිසා ඇඟලුම් කම්හල් වැසී යයි. තේ හා රබර් කර්මාන්තයේ නිරත වන්නට ශ්‍රමය නැත. ඉදිකිරීම් ආශ්‍රිත වඩු හා පෙදරේරු ශිල්පීන්ගේ බරපතල හිඟයක් ඇති හෙයින් මෙරට සංවර්ධන යෝජනා ක්‍රමවල විදේශ ශ්‍රමිකයෝ වැඩ කරති. නමුත් මේ රටේ තරුණන් රුකියා දෙන්නැයි රජයට බල කරති. ඔවුන් ඉල්ලන්නේ රජයේ රුකියාය. යටත් විජිත සමයේ රැජනට සේවය කරන රජයේ සේවයක් ඇතිවිය. ටයි පළඳින, පෙනුමක් ඇති ඔවුන් කළේ ලිපිකරු සේවය මිස රාජ්‍ය තන්ත්‍රයේ තීන්දු ගන්නා රුකියා නොවේ. අදත් තරුණ පරපුර මානසිකව සිටින්නේ මෙම රජයේ රුකියාව උසස්ය යන ආකල්පයේය. උපාධියක් යනු දැනුම ලැබෙන අධ්‍යාපනය මිස රජයේ සේවයට ප්‍රවේශවෙන වත්කමක් නොවේ. මේ නිසා ධනය නිපදවන, නිෂ්පාදනයක නිරතවන සමාජයක් ශ්‍රී ලංකාවේ බිහිවිය යුතුය. ඇමරිකාව මහා ආර්ථිකයක් ගැන කතාකළත් එරට ආර්ථිකයේ සියයට අසූවක් සුළු කර්මාන්තකරුවන්ය. ඉන්දියාවේ, ජපානයේ හෝ තායිලන්තයේ ද තත්ත්වය එයයි. මහා පරිමාන කර්මාන්ත මගින් පර්යේෂණ හා තාක්ෂණික අංශ සංවර්ධනය කරන අතර සුළුකර්මාන්ත මගින් මහජනතාව ව්‍යවසායකයන් බවට පත්කරයි. මේ නිසා රටකට මේ අංශ දෙකම සමබරව පවත්වාගැනීම අවශ්‍යය. අනුන් යටතේ

වැඩ කරන්නට නොව තමන්ම යමක් නිපදවා විකුණා ආදායම වැඩි කරගත යුතුය යන අදහස පාසලෙන් සමාජයට ප්‍රවේශවන දරුවන්ගේ ආදර්ශපාඨය වීම වැදගත්ය. ශ්‍රමාභිමානය හා ව්‍යවසායකත්වය ගැන පළමු පාඩම ඉගෙනගත යුත්තේ පාසැලෙනි. එයින් ධනය බිහිවෙයි. ඒ ධනයෙන් සාධාරණ කොටසක් බදු වශයෙන් රජයට එකතුවන අතර එම කොටස තරගකාරීත්වයෙන් කොන්වන දුප්පත් සමාජයට සහන වශයෙන් දිය හැකිය. ධනය හෝ නිෂ්පාදනය වැඩි නොකර, දැනට පවතින අවස්ථා වලින්තව තවත් බදු අයකරමින් ඒ බදු බඩු මිල අඩු කරන සහන වශයෙන් සපයමින් ගමන් කරන සමාජයකට අනාගතයක් නැත.

වර්තමානයේ ලෝකය පුරා නිෂ්පාදන දියුණු කරන තරගකාරීත්වය තුලින් ඵලදායකත්වය වැඩි කරන ක්‍රම කෙරෙහි අවධානය යොමු කරයි. මේ නිසා අලුත් තාක්ෂණය බිහිවෙයි. සිංගප්පූරුව තමන්ට අභියෝගයක් වී ඇති රටක තරගකාරීත්වයට පදනම් වී ඇති දේ සොයයි. ඔවුන් කරන්නේ එයට වඩා අඩුවෙන් තම පදනම සකස් කර ගැනීමයි. විදුලිය ගාස්තු, තෙල් මිළ, ප්‍රවාහන වියදම් අඩුවන විට නිපැයුමක මිල අඩුවෙයි. රජය කළ යුත්තේ සාධාරණව මේ සේවා සැපයීමයි. යටිතල පහසුකම් නිසි ලෙස සැපයෙන අතර පාලන ක්‍රමය මගින් සාධාරණ අවස්ථා ඇති බව පෙනෙන විට මහජනතාව අලුත් අලුත් දේ නිපදවන්නට පටන් ගනී. වර්තමානයේ මහජනතාවට නිෂ්පාදනය කරන්නට හා ධනය නිපදවන්නට පෙළඹවුවත් එහි පළමු අවස්ථාව ඇති කළ යුත්තේ රජය විසින් ඒ වෙනුවෙන් විශ්වාස කළ හැකි සමාජ ආර්ථික වටපිටාවක් ඇතිකිරීම බවද අවධාරණය කළ යුතුය. පුද්ගලයෙකු ව්‍යාපාරයක් ආරම්භ කරන විටම එයට කඩා පැන බදු අයකරගන්නටත්, විවිධ අණ පණත් මගින් අවසර ගන්නටත් සිදුවන විට කිසිවෙකු තමන් ඇති මුදල අලුතින් ආයෝජනය කරන්නේ නැත. එපමණක් නොවේ, දේශපාලනය විසින් අවස්ථාව නොදෙන බව සිතන විට ව්‍යාපාර අලුතින් ඇතිවන්නේ නැත. ආණ්ඩුව බලා සිටින්නේ තමන් මුදල් යොදවන විටම එයින් කොටසක් උදුරාගෙන පාලනය කරන්නටය යන ආකල්පය ඇති විට බිහිවන්නේ කලු ආර්ථිකයයි. අවසර ගැනීම්, බදු ගෙවීම් නැති ව්‍යාපාර ආර්ථික වර්ධනයක් ඇති කරන්නේ නැත. දේශපාලනය හෙයින් තමන්ට අවස්ථාව නැති වන බව සිතන පිරිසක් මෙයින් ඇති වේ. එය සමාජ බෙදීමකි. දේශපාලන අනුග්‍රහය නැතිව යමක් කරන්නට ඉඩ නැති බව සිතන සමාජය විසින් ඇති කරන්නේ සමාජ පරිහානියයි. නිදහසින් පසු මේ දක්වා ගමන් කර ඇති ගමන තුළ අප විසින් බිහි කර ඇත්තේ එවැනි පරිසරයකි. එයින් බිහිවූ සංස්කෘතිය වෙනස් කිරීම පහසු නැත. විශේෂ කැපවීමකින් හා ක්‍රමය වෙනස් කරන්නට උත්සාහ කරන විට නැගෙන ප්‍රතිවිරෝධතා වලට මුහුණ දීමේ හැකියාවක් අපට තිබිය යුතුය.

දියුණුවට පත්වූ හැම රටකම ධනය නිපදවීම කෙරෙහි උනන්දුවක් දැක්වීය. ඒ වෙනුවෙන් වෙනම කලාප ඇති කළේය. චීනයට හොංකොං විශේෂ කලාපයක් වූයේ ඒ හෙයිනි. නිදහස් වෙළඳ කලාප සංකල්පයට මුල්වූයේ ද ඒ අදහසයි. රට අභ්‍යන්තරයේ සුවිශේෂ පහසුකම්

ඇතිව විනිවිද පෙනෙන අන්දමට අලුත් ව්‍යාපාර හා ව්‍යවසායකත්ව ඇති කර එයින් ආදායම හා රැකියා උත්පාදනය සැලසුම් කෙරිණ. එය අද කලාප වශයෙන් නොව රටවල් දක්වා ව්‍යාප්ත වී තිබේ. වෙළඳාම හා සම්බන්ධ කලාප අනුරාධපුරය වැනි නගරවලින් ද ශ්‍රී ලංකාවේ අතීතය පිරික්සා බලන විට හමුවී තිබේ. යටත් විජිතයක් වීමෙන් පසු ඔවුන් නියම කරන දේ විනා අලුත් එවැනි අවස්ථා කරා සමාජයට ගමන් කළ නොහැකිවිය.

අලුත් ආරම්භයකින් ධනය නිපදවා නිෂ්පාදනය වැඩි කර ආර්ථිකය නැංවීමෙන් විනා මෙම උද්ධමනය පාලනය කිරීම කළ නොහැක්කකි. බඩු මිල වැඩිවන විට තාවකාලික සහන දී මහජනතාව තවදුරටත් රැවටීම වෙනුවට ඔවුනගේ අතට ධනය නිපදවන අවස්ථාව ලබාදීම අවශ්‍යතාවයයි. ඒ වෙනුවෙන් කළයුතු ආර්ථික ප්‍රතිසංස්කරණ රටට දර්ශනයක් විය යුතුය. වාර්ෂිකව ඉදිරිපත්කරන රජයේ අය වැය මගින් කළ යුත්තේ ද එයයි. එකතැනකින් බදු අයකර තවත් තැනකට සහන දීමට වඩා පොදුවේ නිෂ්පාදනය වැඩි කරන ක්‍රියා මාර්ග ගැනීම රටට සැනසිලිදායක අනාගතයක් උදා කරනු ඇත. දැන් පවතින අයවැය විවාදය වුවත් යොමු විය යුතු එවැනි ආකල්ප හා අභිමථාර්ථයන් කෙරෙහිය.

- **මිලින්ද මොරගොඩ**